කලාප අධ්‍යාපන කාර්යාලය - බදුල්ල

**Zonal Education Office - Badulla**

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මෙහෙයවීමෙන් සිදු කරන පෙරහුරු පරීක්ෂණ මාලාව අංක 4

## I පත්‍රය

සකස් කිරීම : චින්තක ප්‍රභාත් පතිරණ
බ / කැන්දගොල්ල ප්‍රාථමික විද්‍යාලය

පරීක්ෂා කිරීම : ඩී. එම් . ප්‍රියන්ත දිසානායක
 බ / කොබ්බෑකඩුව මහ විද්‍යාලය

විභාග අංකය :

කාලය : පැය 01

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :-**


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන් වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත.**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසි සපයනු ලැබේ.

**උත්තර පත්‍රයේ පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/1/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/1/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/1/S/E/MF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | V/1/S/CH |

1. පහත දැක්වෙන කොටුව තුළ ඇති මල් සියල්ල, පළමු ගොඩට මලක් සහ ඉන්පසු වැඩිවන සෑම ගොඩකටම කලින් ගොඩට වඩා මලක් බැගින් වැඩිවන ආකාරයට තබාගෙන ගියවිට අවසාන ගොඩ සැකසීමට අඩුවන මල් ගණන කීයද ?




(1) 7
(2) 4
(3) 3

2. පහත රූපය රූපය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද ?




(1) රූපයේ නිර්මාණය කිරීමට සරල රේඛා ද යොදාගෙන ඇත.
(2) රූපය නිර්මාණය කිරීමට වෘත්ත භාවිතා කර ඇත.
(3) රූපය නිර්මාණය කර ඇත්තේ වක්‍ර රේඛා පමණක් යොදාගෙනය.


3. පහත දැක්වෙන සිදුවීම නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිවෙළ තෝරන්න.



A



B




C



D


(1) A C D B (2) C A D B (3) B A D C

4. ජලය යම් පරිමාවක් පිරවූ බඳුනකට රූපයේ පරිදි කුඩා සනකයක් දමා ඇති අතර ඒ නිසා එම ජල මට්ටම යම්කිසි පරිමාවකින් ඉහළට ගොස් ඇති අයුරු රූපයේ දැකගත හැකිවේ. එලෙස එම ජල මට්ටම **900 ml** සීමාව දක්වා ඉහළට ගැනීමට නම් තවත් සනක කීයක් දැමිය යුතුද ?




(1) 9
(2) 7
(3) 10

- පහත දැක්වෙන්නේ මාර්ග සංදියක සිට එක් එක් නගර වලට ඇති දුර ප්‍රමාණයන් ය. ඒ ඇසුරින් **5 , 6** ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න




**5.** **A** නගරයෙන් පෙරවරු **6.00** ට පැයට **60 km** වේගයෙන් පිටත් වූ යතුරු පැදියක් පෙරවරු **8. 30** ට එක්තරා නගරයකට ළඟා විය යතුරුපැදිය ඇතුල් වූ නගරය කුමක්ද ?

(1) C (2) B (3) D

**6.** එක්තරා නගරයකින් පිටත් වූ මෝටර් රථයක් පැයට **75 km** වේගයෙන් ගමන් කර පැය **3** කට පසු **D** නගරයට ඇතුල් විය මෝටර් රථය පිටත් වූයේ කුමන නගරයකින්ද?

(1) B (2) C (3) A

**7.** මේසයක් මත **1** සිට **10** තෙක් කාඩ්පත් දහයක් තබා ඇති අතර ළමුන් **5** දෙනෙක් වරකට එයින් අහඹු ලෙස කාඩ් පත බැගින් ලබා ගනිති. ඔවුන් ලබා ගත් කාඩ්වල ඇති ඉලක්කම් සියල්ල එකතු කළ විට එකතුව ලෙසලැබිය හැකි වැඩිම එකතුව හා අඩුම එකතුව අතර වෙනස කීයද ?

(1) 40 (2) 15 (3) 25

**8.** වෙළෙන්දෙක් පැන්සල් **4** ක් රුපියල් **100** බැගින් මිලට ගෙන පැන්සල් **3**ක් රුපියල් **100** බැගින් අලෙවි කරයි.රුපියල් **500**ක ලාභයක් ලැබීමට නම් ඔහු අලෙවි කළ යුතු පැන්සල් ගණන

(1) 50 (2) 60 (3) 70

**9.** සෙල්ලම් කාරයක් පිටුපසට **30cm** ඇද අතහැරිය විට ඉදිරියට **4m 24 cm** ක් ගොස් නතර විය. කාරය පසුපසට ඇද නතර කළ ස්ථානයේ සිට ඉදිරියට ගොස් නතර වූ ස්ථානය තෙක් ඇති දුර කොපමණද ?

(1) 4 m 24 cm (2) 3 m 84 cm (3) 4 m 54 cm

**10.** විදුලි බුබුල ආලෝකය නම් , විදුලි පංකාව ...........................


(1) උණුසුම (2) සුළඟ (3) ශබ්දය

**11.** රටාව අනුව ඊළඟට අයුතු සංඛ්‍යාව තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | 5 | 11 | 23 | .... | .... |


(1) 33 , 43 (2) 46 , 86 (3) 47 , 95

**12**




(1) 5 (2) 4 (3) 8

**13 .** එකිනෙක හරහා ගමන් කළ හැකි මාර්ග ජාලාවක් පහත රූපයේ දැක්වේ. එහි පසෙකින් දක්වා ඇති මෝටර් රථය මාර්ග ජාලාවට ඇතුල්වන අතර ,මෝටර් රථය හැරවිය හැක්කේ වම් පැත්තට පමණක් නම් . එම මෝටර් රථයට පිටතට පැමිණිය හැකි ස්ථානය කුමක්ද ?




**(1)** B **(2)** C **(3)** D

**14 .** පහත දැක්වෙන්නේ දුරකථනයක දෝශ සහිත යතුරු පුවරුවකි. මෙම යතුරු පුවරුවෙන් **093 928 47 36** යන නිවරදි දූරකථන අංකය සටහන් කළද එය **093 428 97 36** ලෙස සටහන් විය. දූරකථන යතුරු පුවරුවේදෝෂය විය හැක්කේ මින් කුමක්ද ?





**( 1)** අංක **6** සහ **7** යන ඉලක්කම් මාරුවී සටහන් වීම.


**( 2)** අංක **9** සහ **4** මාරු වී සටහන් වීම.

**( 3)** අංක **0** සහ **9** මාරු වී සටහන් වීම.


**15.** පහත දැක්වෙන්නේ ඝනකයක් සෑදීමට යොදා ගන්නා පතරොම් කිහිපයකි. ඒ අනුව නොගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



**(1)**



**(2)**



**(3)**


**16.** ජගත් සහ සුගත් සෑම වසර දෙකකට වරක් ම සිරිපාදය වන්දනා කිරීමට යති. **2026** වර්ෂයේ ජගත් **26** වන වතාවටත් සුගත් **13** වන වතාවටත් සිරිපා කරුණා කරන ලද්දේ නම් සිරිපාදය නැගීමට ආරම්භ කළ වසරේ සිට මේ වසර දක්වා ඔවුන් දෙදෙනාට ඒ සඳහා ගත වූ කාලයන් ගේ වෙනස කීයද ?

**(1)** 52 **(2)** 26 **(3)** 24

**17. 240** න් **½** න් බාගයට **10** ක් එකතු කළ විට පිළිතුරු කීයද?

**(1)** 70 **(2)** 130 **(3)** 60

**18.** එකම ප්‍රමාණයේ සමචතුරස්‍රාකාර කඩදාසි තුනකින් කැපූ පහත හැඩතල තුනෙහි වටේ දිග සම්බන්ද ව නිවරදි ප්‍රකාශය කුමක්ද ?



(1) දිගින් සමානයි (2) වටේ දිග වෙනස් ය

(3) නිශ්චිතව කිව නොහැකිය.

**19.** රෝස සුවඳ හඳුන්කූරක් විනාඩි **35**ක් දැල්වෙන අතර, නාමල් සුවඳ හඳුන් කූරක් විනාඩි **25**ක් දැල්වේ.රෝස සුවඳ හඳුන්කූරු **3** ක් සහ නාමල් සුවඳ හඳුන් කූරු **5** ක් එකවර දැල්වූයේ පෙ.ව. **7.00** ට නම් ඒවා සියල්ල නිවී යන්නේ කීයටද ?

**(1)** පෙ.ව. 7. 35 **(2)** පෙ.ව. 7.25 **(3)** පෙ.ව. 8.00

**20.** පාසලක ප්‍රාථමික අංශයේ සිසුන් තිදෙනෙක් තමන් ඉගෙන ගන්නා පන්තිය පිළිබඳ ව කළ විවිධ ප්‍රකාශයන් පහත දැක්වේ. ඔවුන්ගෙන් නිමල් සෑම විටම සත්‍ය පවසන අතර කමල් හා රුවන් සෑම විටම අසත්‍යය පවසයි. එම ප්‍රකාශ අනුව කමල් ඉගෙන ගන්නා පන්තිය විය හැක්කේ කුමක්ද?

- කමල් : මම **4** ශ්‍රේණියේ ඉගෙන ගන්නා අතර නිමල් **2** ශ්‍රේණියේ ඉගෙන ගනු ලබයි.
- නිමල් : කමල් **5** වන ශ්‍රේණියේ නොවන අතර රුවන් **3** වන ශ්‍රේණියේ ළමයෙකි.
- රුවන් : නිමල් 1 වන ශ්‍රේණියේ ඉගෙනුම නොලබන අතර. මම 4 ශ්‍රේණියේ ඉගෙන ගනිමි.

(1) 1 ශ්‍රේණිය **(2)** 2 ශ්‍රේණිය (3) 4 ශ්‍රේණිය

**21.** යෝගට් **10** ක් මිලදී ගන්නා විට යෝගට් **6** ක් නොමිලේ ලැබෙන අතර , ඊට අඩුවෙන් ගන්නේ නම් නොමිලේ යෝගට් නොලැබේ. යෝගට් එකක මිල රුපියල් **64**කි. යෝගට් **50** පමණක් අවශ්‍ය වූ පුද්ගලයෙක් ඒ සඳහා ගෙවිය යුතු මුදල කීයද ?

**(1)** රු. 3200 **(2)** රු. 2048 **(3)** රු. 2560

**22.** පැරණි බට්ටා ඔරලෝසුවක් එක්වරක් වයින් තැබීමෙන් පසු දින **3** යි පැය **5** කාලයක් නොනවත්වා ක්‍රියාත්මක වෙයි. **2024** පෙබරවාරි මස **27** වැනි දින සවස **4.00** ට මෙම ඔරලෝසුව එක්වරක් වයින් තැබුවේ නම්, ඔරලෝසුව ක්‍රියා විරහිතවන දිනය හා වේලාව කුමක්ද?

**(1)** මාර්තු 3 සවස 4.00 **(2)** මාර්තු 4 සවස 4.00 **(3)** මාර්තු 1 රාත්‍රී 9.00

**23.** මීට වසර දෙකකට පෙර මාගේ සීයාගේ **67** වන උපන්දිනය දවසේදී මාගේ අම්මා පැවසුවේ,ඇය උපදින විට ඇගේ පියා ගේ වයස අවුරුදු 32 බවය. එසේ නම් දැන් අම්මාගේ වයස කීයද ?

**(1)** අවුරුදු 35 **(2)** අවුරුදු 33 **(3)** අවුරුදු 37

**24.** පහත දැක්වෙන විනිවිද නොපෙනෙන පෙට්ටි තුළ ඒවායේ සඳහන් කර ඇති වර්ණයෙන් හා ප්‍රමාණවලින් වීදුරු බෝල දමා ඇත. පළමු පෙට්ටියේ ඇති වීදුරු බෝලවලින් එකක් අහඹු ලෙස ගෙන දෙවන පෙට්ටියට ද පසුව 2 පෙට්ටියේ ඇති වීදුරු බෝල වලින් එකක් අහඹුලෙස ගෙන තුන්වන පෙට්ටියට ද දමයි. මෙලෙස පෙට්ටි සියල්ලට ම බෝලය බැගින් මාරු කළ පසු සිදුවිය නොහැකි දේ කුමක්ද?




**(1)** රතු පාට බෝල දමා ඇති පෙට්ටියේ කොළපාට බෝලයක් තිබීම.


**(2)** කහ පාට බෝල දමා තිබූ පෙට්ටියේ නිල් පාට බෝලයක් තිබීම.

**(3)** කොළපාට පෙට්ටියේ නිල් හෝ රතු වීදුරු බෝලයක් තිබීම.

**25.** නිමල් උදෑසන ගමනක් යමින් සිටි අතර, ඔහු ගමන් කරන දෙසටම මෝටර් රථයක් ඔහු පසුකරමින් පසුපසට ධාවනය කරනු දක්නට ලැබුණි. එම මෝටර් රථයේ සෙවනැල්ල මෝටර් රථයට කෙලින්ම ඉදිරියෙන් වැටී තිබුණි නම්, නිමල් ගමන් කරන්නේ කුමන දිශාවට ?

(1) දකුණ ට (2) බස්නාහිර ට (3) නැගෙනහිර ට


**26.**




විනාඩියකට ජලය ලීටර් 10 බැගින් පිටවන නලයක් A ටැංකියට සම්බන්ධ කර එය හරි මැදින් දෙකට බෙදා B හා C ටැංකි දෙක පුරවනු ලබයි. රූපය හොඳින් නිරීක්ෂණය කර B ටැංකිය සම්පූර්ණයෙන්ම පිරීමට ගතවන කාලය සොයන්න.


(1) මිනිත්තු 50 (2) මිනිත්තු 100 (3) මිනිත්තු 200

**27.** පහත රූප සටහනේ සුළං දිශා දර්ශකය සහ තවත් රූප කිහිපයක් නිවැරදිව ඇඳ ඇති අතර රූප දෙකක් වැරදි ලෙස ඇඳ ඇත.වැරදි ලෙස ඇඳ ඇති රූප දෙක කුමක්ද ?



(1) කොඩිය සහ පොල් ගස (2) පොල් ගස සහ සරුංගලය (3) කොඩිය සහ සරුංගලය

**28.** පළමු රූපයේ දැක්වෙන ආකාරයේ කඩදාසියක් දිත් ඉරි දිගේ නමා. පසුව කඩ ඉරි දිගේ කැපූ විට ලැබෙන මුළු ත්‍රිකෝණ ගණන කීයද



(1) 4

(2) 3

(3) 2

**29.** " ගින්න බල සම්පන්නය , ජලය ගින්නට වඩා බලසම්පන්නය , පෘථිවිය ජලයට වඩා බල සම්පන්නය , මිනිසා ඒ සියල්ලටම වඩා බලසම්පන්නය ' මෙයින් කියවෙන්නේ මිනිසාගේ කවර ගුණයක් පිළිබඳවද ?

(1) මිනිසාට ඇති ගින්දර නිවීමේ හැකියාව. (2) මිනිසාගේ බලය හා ශක්තිය

(3) පෘථිවිය වඩා බලසම්පන්න වන බව.

**30 .** රටාව අනුව ඊළඟට අයුතු රූපය තෝරන්න.







(1)  (2)  (3) 

**31.**නිමල්ගේ පොඩිපුතා කමල් මාගේ බාප්පා නම් , කමල්ගේ අයියා වන සුනිල් මාගේ කවුරුන් විය නොහැකිද?


**(1)** බාප්පා **(2)** තාත්තා **(3)** මාමා

**32.**පහත දැක්වෙන ඔරලෝසුවේ ඇති වේලාවේ **A** දර්පණය මත පතිත වන අතර **A** දර්පනය මත ඇතිවන ප්‍රතිබිම්බය **B** දර්පණය මත පතිත වෙයි. එවිට **B** දර්පණය මත ඇතිවන ප්‍රතිබිම්බය වන්නේ කුමක්ද ?




**(1)**  **(2)**  **(3)** 

**33.**



පහත දැක්වෙන්නේ කුඩා ඝනකවලින් විශාල ඝනක නිර්මාණය කර ඒවා එක මත එක තබා ඇති රටාවකි.මෙහි තට්ටු පහක් පවතින අතර ඉහළම තට්ටු තුන පමණක් රූපයේ දැක්වේ. එසේ නම් එහි පහළම තට්ටුව නිර්මාණය කිරීමට යොදාගෙන ඇති ඝනක ගණන කීයද?

**(1) 27** **(2) 64** **(3) 125**


**34.**පෝලිමක නිමල්ට ඉදිරියෙන් ළමුන් **7** දෙනෙක්ද නිමල්ට පිටුපසින් ළමයින් **5** දෙනෙක්ද සිටිති. පසුව පෝළිමේ පිටුපසට ළමුන් **9** දෙනෙක් එකතු වූ අතර පෝලිමේ මුලින් ළමයි තුන්දෙනෙක් ඉවත් වී ගියෝය දැන් නිමල්ට පෝලිමේ හරි මැද ළමයා බවට පත්වීමට ළමුන් කීදෙනෙකු පසු කර යා යුතුද?

**(1) 4** **(2) 5** **(3) 3**

**35 .**පැළ තවානකට දිනකදී පැමිණි මුළු පිරිස **44** කි .එයින් **29** දෙනෙක් පලතුරු පැළ ලබා ගත් අතර **25** දෙනෙක් මල් පැළ ලබා ගත්හ. පැළ වර්ග දෙකම ලබාගත් යම් පිරිසක්ද සිටි අතර , පලතුරු පැළ පමණක් සහ මල් පැළ පමණක් ලබාගත් මුළු පිරිසේ එකතුව කීයද?

**(1) 10** **(2) 54** **(3) 34**

**36.** පහත දැක්වෙන්නේ ඝනකාභ කිහිපයක් ඇලවීමකින් තොරව විවිධ හැඩවලට තබා සාදා ඇති නිර්මාණයකි. එහි අංක **4** ඝනකාභය පමනක් ඉදිරිපසින් පිටුපසට තල්ලු කරමින් ඉවතට ගනු ලබයි . එය ඉවතට ගත්පසු පෙර පිහිටීම වෙනස් වන ගනකාභ ගණන කීයද ?






**(1)** **1**

**(2)** **5**

**(3)** **3**

**37.** පහත රූපයේදී ඇති ඉඩමෙහි හරි මැදින් පුද්ගලයෙක් නැගෙනහිර බලා සිටගෙන සිටින අතර, ඉඩමේ **A ,B, C ,D** ලෙස නම් කර ඇති ස්ථාන හතරෙහි ආරක්ෂිත කැමරා **4** ක් සවිකර ඇත. එහි එක් කැමරාවක් පමණක් අක්‍රිය වී තිබූ අතර. අනෙක් කැමරා තුනෙන් ඉඩම මැද සිටින පුද්ගලයාගෙ ලබාගත් ඡායාරූප තුනක් රූපයේ දැක්වේ. ආරක්ෂිත කැමරාවලින් අක්‍රිය වී ඇති කැමරාව කුමක්ද?



**(1)** **A** කැමරාව

**(2)** **C** කැමරාව

**(3)** **D** කැමරාව


**38.** නිවැරදිව පද බෙදා ලියා ඇති වාක්‍ය තෝරන්න.

**(1)** අක්කා අඹ වලට බොහෝ කැමැත්තක් දක්වයි.

**(2)** පණ්ඩුකාභය රජ තුමා අභය වැව සෑදුවේ ය.

**(3)** තාත්තා පාන්දරින් ම රැකියාව ට ගියේ ය.

**39.** පහත දැක්වෙන්නේ මාර්ගයක කොටසකි. රූපය අනුව බදුල්ල ට බස් රථයකින් ගමන් කළ යුතු පුද්ගලයෙක් බසයක් නවත්වා ගැනීමට සිට ගත යුතු නිවරදි ස්ථානය කුමක්ද ?




**(1)** **A** **( 2)** **B** **(3)** **C**

**40.** **2** සිට **84** තෙක් ඇති සංඛ්‍යාවල කුඩාම ඔත්තේ සංඛ්‍යාවෙන් විශාලම ඉරට්ටේ සංඛ්‍යාව ගුණ කළ විට පිළිතුර කීයද ?

**(1)** **168** **(2)** **252** **(3)** **240**

කලාප අධ්‍යාපන කාර්යාලය - බදුල්ල

**Zonal Education Office - Badulla**

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මෙහෙයවීමෙන් සිදු කරන පෙරහුරු පරීක්ෂණ මාලාව අංක 04

## II පත්‍රය

සකස් කිරීම : චින්තක ප්‍රභාත් පතිරණ
බ / කැන්දගොල්ල ප්‍රාථමික විද්‍යාලය

පරීක්ෂා කිරීම : ඩී.එම්. ප්‍රියන්ත දිසානායක
බ / කොබ්බෑකඩුව මහා විද්‍යාලය

විභාග අංකය :

කාලය : පැය 01 යි මිනිත්තු 15 යි

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :-**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන් වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත.**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසි සපයනු ලැබේ.

**උත්තර පත්‍රයේ පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/1/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/1/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | <br>V/1/S/E/MF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | <br>V/1/S/CH |

01 . පහත ඡේදයේ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහ සයුරේ රළ අතර ජීවිතය සොයන ධීවර කර්මාන්තය, මෙරට ආර්ථිකයේ මෙන්ම සංස්කෘතියේ ද නොමැකෙන සලකුණකි. අලුයම් කාලයේ රන්වන් හිරු රැස් පතිත වන විට පන්න ක්‍රම සහ දැල් ආම්පන්න රැගෙන දියඹට යන ධීවරයන්, දැඩි වෙහෙසක් දරා දේශයට අවශ්‍ය ප්‍රෝටීන් සපයන නිහඬ සේවකයන් පිරිසකි. කරදිය මෙන්ම මිරිදිය ජලාශ ඇසුරින් ද ව්‍යාප්ත වී ඇති මෙම ජීවනෝපාය, දහස් ගණනකගේ කුසගින්න නිවන මහා පින්කමකැයි කීම වරදක් නොවේ. නවීන තාක්ෂණය හා මුසුවෙමින් දියුණු වන මෙම ක්ෂේත්‍රය, විදේශ විනිමය උපයන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස රටේ අනාගත අභිවෘද්ධියට ද මහත් ශක්තියක් ලබා දෙයි.

(i) ඡේදයේ සඳහන් වන්නේ කුමන කර්මාන්තයක් ගැන ද ?

..........................................................................................................................

(ii) මෙම කර්මාන්තය නොමැකෙන සලකුණක් වන්නේ කවරකද ?

..........................................................................................................................

(iii) ඡේදයේ සඳහන් ප්‍රාණවාචී බහු වචන අනුක්ත පදයක් ලියන්න ?

..........................................................................................................................

(iv) මෙම කර්මාන්තය ව්‍යාප්තව ඇත්තේ කුමන ජලාශ ආශ්‍රිතවද ?

..........................................................................................................................

(v) ඡේදයේ සඳහන් පරිදි ධීවරයෝ රටට සපයන පෝෂ්‍ය පදාර්ථය කුමක්ද ?

..........................................................................................................................

(vi) " ජීවත්වීමේ මාර්ගය " යන්න ඡේදයේ සඳහන් වන්නේ කෙසේද ?

..........................................................................................................................

02 . සුදුසු වර්තමාන කාල ආඛ්‍යාත පදය ලියන්න.

මම අම්මා සහ අයියා සමඟ එකතු වී නිවස පිරිසිදු ..............................................

03 . පහත සඳහන් නාම පදවල යටින් ඉරක් ඇඳි අකුරට යෙදී ඇති පිල්ලම් හඳුන්වන්න

( i ) " <u>කෘ</u>මියා "........................................ (ii) " <u>ශෛ</u>ලමය" ........................................

04 . පහත දී ඇති අදහසට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.

( i ) වගකීමෙන් බේරීම -

..........................................................................................

( ii ) රවටනු පිණිස වර්ණනා කිරීම. -

..........................................................................................

05 . නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

( i ) නිලධාරි , ගැලපෙන , තරඟය , ඔලුව

( ii ) එලදෙන , කසල , පිළිවෙල , පිළියෙල

06 . හිස්තැනට ගැලපෙන නිවැරදි ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ලියන්න.

( i ) ඇය දිනපතා උදෑසනම අවදි .................................... ( වූවා ය. / වූවේ ය )
( ii ) ඔහු සරුංගලය රැගෙන මිදුලට .................................... (ගියහ. / ගියේ ය )
( iii ) ඔවුහු ගුවන් විදුලියට සවන් .................................... ( දුන්නා ය. / දුන්හ )
( iv ) ඌ ඉහළ අහසේ .................................... ( පියාඹයි. / පියාඹති )

07 . සුදුසු විරාම ලකුණු යොදන්න

( i ) ඔයා ඒ පොත ගෙනාව ද තරුෂි ඇසුවා ය
( ii ) ජීවක වෙද තුමනි මා හට අවුරුදු හතක් තිස්සේ නින්දක් නැත

08 . පහත සඳහන් පද ගළපා අර්ථවත් වාක්‍යයක් සාදන්න

( i ) පුද්ගලයෙකි / වත්තුහාමි / වූ / ගොවියකු / කාර්යශූර / ධනවත්
....................................................................................................

( ii ) අත්තම්මලා / දවස් / ම / සිටිති / සතියේ / පහ / යන / පාසල්
....................................................................................................

09 . පහත දී ඇති ඉංග්‍රීසි වචන සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

( i ) milk.................................... ( ii ) nose ....................................

10 . පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.


( i ) What .................................... you doing ? ( is , are )

( ii ) I have .................................... pet ( a , are )

11 . පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න.
I can fly.


....................................................................................................

12 . දී ඇති රූපවලට අදාල දෙමළ වචනය සිංහල අකුරෙන් ලියන්න.

( i )  ..........................  ..........................

13 . පහත සඳහන් දෙමළ වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.

එන්න වේණ්ඩුම් - .................................................................... (1×29)

14. 


(i) රවුම තුළ ඇති ඉලක්කම් සියල්ලම එකිනෙක එකතු කර එම පිළිතුර දෙකෙන්ගුණකර අවසාන පිළිතුර අකුරෙන් ලියන්න.

..............................................................................

(ii) එම ඉලක්කම්වලින් සෑදිය හැකි විශාලම සංඛ්‍යාව කුමක්ද? .................................. (2×2)

15 . දී ඇති සංඛ්‍යා රටාවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.


( i ) 3 , 9 , 27 , 81 , ..................... , .....................

( ii ) 105 , 115 , 130 , 150 , ..................... , ..................... (1×2)

16 . ධාරිතාවය 20 l ක් අල්ලන වතුර ටැංකියක දැනට 8 l 950 ml ක් පිරී ඇත. ටැංකිය සම්පූර්ණයෙන් ම පිරීමට තවත් ජලය කොපමණ ප්‍රමාණයක් අවශ්‍යද ?

.........................................................

17 . පහත සඳහන් ඝන වස්තු අතරින් වක්‍ර මුහුණත් දක්නට නොලැබෙන ඝන වස්තුවේ නම ලියන්න.



..................................................................

18 . ක්‍රිකට් තරගය ආරම්භ වුණේ පස්වරු 2.45 ටය. ඉන් පැය 3 යි මිනිත්තු 35 කට පසු එය අවසන් විය. ක්‍රිකට් තරගය අවසන් වූ වේලාව සම්මත ඔරලෝසු වේලාවෙන් ලියන්න.

...............................


19 .මිනිසෙක් තම දිනක වැටුප වන රුපියල් 4500 කින් 0.4 ක් ආහාර සඳහා වෙන්කරයි. ඔහු ළඟ ඉතිරි වන මුදල කීයද ? ..................................................................................

20. මෙහි පිළිතුර රෝම සංඛ්‍යාවෙන් ලියන්න.

x i + i x = .........................................................

21 . තේ කොළ 2 kg 750 g කින් 250 g පැකට් සාදා එක් පැකට්ටුවක් රුපියල් 100 බැගින් විකුණූ විට ලැබෙන මුදල කීයද ? ....................................................................

22 . දී ඇති තොරතුරු ඇසුරින් B සිට D දක්වා ඇති දුර සොයන්න




- A සිට D තෙක් දුර 157 km
- D සිට E තෙක් දුර 69 km
- A සිට B තෙක් දුර = D සිට E තෙක් දුර ▪

B සිට D තෙක් දුර කීයද ?.............................. (2×7)

23 . බිල්පතේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| භාණ්ඩය | 1 kg ක මිල | මිලදීගත් ප්‍රමාණය | මිල |
|---|---|---|---|
| පරිප්පු | රු.240.00 | 250 g | ________ |
| සීනි | රු.360.00 | 750 g | ________ |
| සහල් | ________ | 5 kg | රු. 750.00 |


(1×3)

24.නගරයකට ඉරිදා ඇතළු වූ වාහන සංඛ්‍යාව 1956 කි.සඳුදා ඇතුළුවූ වූ වාහන සංඛ්‍යාව 1497 කි.සඳුදාට වඩා ඉරිදා ඇතුල් වූ වාහන සංඛ්‍යාව කොපමණ වැඩිද?..................................

25. බීම සෑදීම සඳහා පන්තියේ ළමුන් විසින් දෙහි ගෙඩි 8 බැගින් ගෙනා අතර, එලෙස ගෙනෙන ලද මුළු දෙහි ගෙඩි ගණන 320 ක් නම් , පන්තියේ සිටින මුළු ළමුන් ගණන කීයද ?
..........................................

26.කර්මාන්ත ශාලාවක සිටින සේවකයින් ගණන 1468 ක් වන අතර සේවිකාවන් ගණන 2196 කි. කර්මාන්ත ශාලාවේ සිටින මුළු සේවක සේවිකාවන් ගණන කීයද?.......................(2×3)

27.



රූපයේ අඳුරු නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න ..............................

28. රූපයේ අඳුරු කළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න ................................ (2

29 .පෙට්ටියක අඹ ගෙඩි 204 බැගින් පෙට්ටි 4 ක ඇති අඹ ගෙඩි ගණන කීයද ?.....................(2×1)

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

30 .හැඩය අනුව අනෙක් ඒවාට වඩා වෙනස් වන ශාක පත්‍රයකි.

(i) කරපිංචා (ii) නිදිකුම්බා (iii) සේර

31 . පහත ශාක අතරින් කඳේ වට ප්‍රමාණය වැඩිම ශාකය වන්නේ.

(i) අඹ (ii) නුග (iii) පොල්

32. මාංස භක්ෂක සතුන් පමණක් පරිසරයේ සිටී නම් සිදුවිය නොහැකි දේ කුමක්ද ?


(i ) පරිසරයේ සිටින සතුන් අතර දරුණු සටන් ඇතිවීම (ii) සතුන් ශීඝ්‍රයෙන් වඳවී යාම

(iii) මාංශ භක්ෂක සතුන් තණකොළ ආහාරයට ගැනීම.

33. අපිරිසිදු ජලය පානය නිසා සෑදිය හැකි රෝගයකි.

(i) ජලභීතිකාව (ii) පැපොල (iii) පාචනය

**34 .** පහත දැක්වෙන්නේ පාසල් දරුවකු විසින් සකසන ලද ජලාශයක වේල්ලක ආකෘතියකි.එහි ඉහළින් සහ පහළින් ඇති සිදුරු දෙකකින් කුඩා නළ දෙකක් දමා ඒවාට වෙන වෙනම ජල රෝද දෙකක් සවිකර එම ආදර්ශ ජලාශය ජලයෙන් පුරවන ලදී. එවිට නළ දෙකෙන් ජලය පිටතට ගලාඒමට පටන් ගත් අතර ,ඒ අනුව පහත ප්‍රකාශ අතරින් සිදුවිය හැකි නිවැරදි දෙය කුමක්ද ?




(i) A ජල රෝදය වේගයෙන් කරකැවේ .

(ii) B ජල රෝදය වේගයෙන් කරකැවේ.

(iii) ජල රෝද දෙකම එකම වේගයකින් කරකැවේ

**35.** බිත්තරයක් ජලයට දමා එම ජලයට ලුණු දියකරයි. දිය කරන ලුණු ප්‍රමාණය ටිකෙන් ටික වැඩි කිරීමේදී බිත්තරයට සිදු විය හැකි දේ කුමක්ද ?

(i) බිත්තරය වතුරේ ටිකෙන් ටික ගිලීයාම. (ii) බිත්තරය ටිකෙන් ටික මතුපිටට පැමිණීම.

(iii) ආරම්භයේ සිටම බිත්තරය ජලයේ පාවෙමින් තිබීම.

**36 .** පුද්ගලයෙක් විසින් දිනකට පානය කළ යුතු ජල ප්‍රමාණය පිළිබඳව නිවැරදි සටහන පහත සඳහන් ඒවායින් කුමක්ද ?

(i) $\frac{\text{ශරීර බර(කි.ග්‍රෑ)}}{30}$ (ii) $\frac{30}{\text{( ශරීර බර කි. ග්‍රෑ)}}$ (iii) $\frac{\text{ශරීරයේ උස ( මීටර් )}}{30}$

**37.** " සත්වෙත් මහත් අදර " මෙම වන්නම් කොටස අයත් වන වන්නම වන්නේ.

(i) මුසලඩි වන්නම (ii) තුරගා වන්නම (iii) හනුමා වන්නම

**38.** මේ අතරින් ක්‍රීඩකයන් විසින් වැඩිම ආරක්ෂක උපකරණ පළඳින ක්‍රීඩාව වන්නේ.

(i) ක්‍රිකට් (ii) වොලිබෝල් (iii) පාපන්දු

**39.** දරුවෙකුට කරදරයක් සිදුවන මොහොතක ඒ පිළිබඳ දැනුම් දිය හැකි දුරකථන අංක දෙකක් වන්නේ.

(i) 1990 / 119 (ii) 1919 / 1990 (iii) 1929 / 119

**40.** සමාජ විරෝධී ක්‍රියා සම්බන්ධව අසත්‍ය ප්‍රකාශයක් වන්නේ.

(i) දඬුවම්වලට ලක්වීම (ii) සමාජයේ පිරිස් නොසැලකීම (iii) ආත්ම ගරුත්වය ඇතිවීම.

**41.** වර්තමානයේදී ජනප්‍රිය වෙමින් පවතින අලුතින්ම හඳුන්වා දෙන මුදල් ගෙවීමේ ක්‍රමයකි.

(i) ක්‍රෙඩිට් කාඩ් (ii) වීසා කාඩ් (iii) Q R සංකේත

**42.** ප්‍රෝටීන් අඩංගු සත්ත්ව නොවන ආහාරයක් වන්නේ.

(i) චීස් (ii) පරිප්පු (iii) බිත්තර

**43 .** අප ගන්නා ආහාර වෙනස්වීමට බලපාන කාරණයක් නොවන්නේ.

**(i)** රැකියාව **(ii)** වයස **(iii)** මානසික තත්ත්වය

**44 .** පහත දැක්වෙන්නේ පන්තියක ප්‍රදර්ශනය කර තිබුණු පුවරුවකි. එයින් අදහස් නොකෙරෙන දේ කුමක්ද ?


<u>ඩෙංගු රෝගය ඇති කරන්නෝ ද අපි ම යි. නැති කළ හැක්කේ ද අපට</u>

**(i)** ඩෙංගු පැතිරෙන්නේ මිනිසුන්ගේ නොසැලකිල්ල නිසාය.
**(ii)** මිනිසුන් විසින් ඩෙංගු රෝගය ඇතිකර පසුව නැති කරයි.
**(iii)** ඩෙංගු රෝගය නැති කළ හැක්කේ ද මිනිස්සුන්ට පමණි.

**45 .** වැසි දිනයකදී දොර ජනෙල් සියල්ල වසා දැමූ වාහනයක වීදුරුවල ඇතුල් පැත්තෙන් ජල වාෂ්ප තැන්පත් වීමට හේතුව කුමක්ද ?

**(i)** වැසි ජලය වීදුරුවෙක් ඇතුළට කාන්දු වීම.
**(ii)** පිටත පරිසරය සිසිල්වීමත් වාහනය තුළ උෂ්ණත්වය වැඩිවීමත් නිසා ජල වාෂ්ප ජලය බවට පත්වීම
**(iii)** වාහනේ ඇති කවුළුවලින් ඇතුලට පින්න පැමිණීම නිසා.

**46 .** පහත දැක්වෙන්නේ විද්‍යුත් චුම්භකයක රූපයකි. ඒ හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?




**(i)** යකඩ ඇණයක් වෙනුවට පිත්තල ඇණයක් භාවිතා කළ හැක
**(ii)** දිගු වේලාවක් ක්‍රියාත්මක තත්වයේ පවතින විට චුම්බක බලය වැඩිවේ.
**(iii)** දිගු වේලාවක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින විට කොයිල් කම්බිය රත්වෙයි

**47.** ශ්‍රී ලංකාවේ ඒක දේශික පක්ෂියෙකි.

**(i)** කැහි බෙල්ලා **(ii)** මයිනා **(iii)** ගේ කුරුල්ලා

**48.** ශ්‍රී ලංකාවේදී දැනට හමු නොවන ඛනිජ සම්පතකි

**(i)** බොරතෙල් **(ii)** මැණික් **(iii)** මිණිරන්

**49.** ශ්‍රී ලංකාවේ රජය මගින් පමණක් ජනතාවට සපයන සේවාවකි.

**(i)** සෞඛ්‍ය **(ii)** අධ්‍යාපනය **(iii)** දුම්රිය සේවය

**50.** සීතල දේශ ගුණයක් අත් විඳීමටත්, ගල්පර්වතයක් මත ඉදිකළ පැරණි බලකොටුවක් නැරඹීමටත්, බුදුන් වහන්සේගේ දන්තධාතූන් වහන්සේ වැඳපුදා ගැනීමටත්.ඔබ යා යුත්තේ කවර පළාතකටද ?

**(i)** ඌව **(ii)** සබරගමුව **(iii)** මධ්‍යම

**51.** සූර්ය නමස්කාරයේ ඇතුළත් පියවර ගණන කීයද?

(i) 12 (ii) 13 (iii) 5

**52.** තරු නිරීක්ෂණය සඳහා යොදා ගන්නා උපකරණයක් වන්නේ.

(1) අන්වීක්ෂය (ii) මාලිමාව (iii) දුරේක්ෂය

**53.** ආධාරක දිගේ ඉහළට නොවැඩෙන ශාකයකි.

(i) කරවිල (ii) දඹල (iii) බතල

**54.** සූර්යාලෝකය නොලැබෙන විට ශාකයක පත්‍ර.

(i) මැලවී යයි (ii) කහ පැහැති වේ. (iii) පත්‍රය හොඳින් වර්ධනය වේ.

**55.** ශාක පත්‍රයේ යට කොටසේ බිත්තර අලවන සතෙක් වන්නේ.

(i) සමනලයා (ii) මී මැස්සා (iii) බඹරා

**56.** ශරීරයේ ලෙඩ රෝග වලින් ආරක්ෂා කරන පෝෂ්‍ය පදාර්ථය වන්නේ.

(i) ප්‍රෝටීන් (ii) විටමින් (iii) කාබෝහයිඩ්‍රේට්

**57.** රාමසාන් උත්සවය සමරනු ලබන ජන වර්ගය වන්නේ.

(i) මුස්ලිම් ජනයා (ii) දෙමළ ජනයා (iii) සිංහල ජනයා

**58.** විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යක් නොවන්නේ,

(i) CFL බල්බ (ii) ප්ලාස්ටික් (iii) ජංගම දුරකථන

**59.** විටමින් A අඩංගු ආහාරයකි.

(i) නෙල්ලි (ii) බත් (iii) වට්ටක්කා (1×30)

**60.**" පුවත්පත් කියවීමේ අගය " යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාක්‍ය තුනක් ලියන්න එක් වාක්‍යයක වචන පහකට වඩා වැඩිවිය යුතු අතර, උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය.

(i)......................................................................................................

..........................................................................................................

(ii).....................................................................................................

..........................................................................................................

(iii)....................................................................................................

..........................................................................................................

(ලකුණු 6)